සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

முதலாம் தவணைமதிப்பீடு - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 01 |

**1- 40 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න**

1. '' එම්මානුවෙල් '' යන නාමේ අර්ථය,
   1. දෙවියන් වහන්සේ උසස්ය.
   2. දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව සමඟයි
   3. දෙවියන් වහන්සේ අප සමඟයි
   4. දෙවියන් වහන්සේට මහිමය වේවා

2. ජේසුස් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ අනාවැකි පැවසූ දිවැසිවරයා වන්නේ
   1. යෙසායා 2. මලාකි 3. එලියා 4. ජෙරමියා

3. මෙසියස් වහන්සේගේ රාජ්‍ය තුළ දක්නට ලැබෙන වටිනාකම් අතර ඉතා වැදගත් වන්නේ
   1. යුක්තිය හා සාමය
   2. දයාව හා ධර්මිෂ්ඨකම
   3. යුක්තිය හා ධර්මිෂ්ඨකම
   4. දයාව හා සාමය

4. ඉශ්‍රායෙල් අධිපතීත්වය දැරීමට පැමිණෙන තැනැත්වහන්සේ පිළිබඳ අනාවැකි පැවසුවේ
   1. ජෙරමියා 2. ආමොස් 3. හොෂියා 4. මලාකි

5. එතුමා කලකිරෙන්නේවත්, අධෛර්යට පත් වන්නේවත් නැත. මෙසේ පැවසුවේ ජේසුස් වහන්සේගේ සේවය,
   1. බලය මත ක්‍රියා කරන බව පෙන්වා දීමට ය.
   2. අභියෝග ඉදිරියේ නොසැලෙන බව පෙන්වීමට ය.
   3. කලකිරෙන නමුත් නොසැලෙන බව පෙන්වා දීමට ය.
   4. අභියෝග ඉදිරියේ සාකච්ඡා කරන බව ය.

6. කිතුනු අප කටුක අත්දැකීම් හරහා ගමන් කරන විට ගත යුතු වඩාත් සුදුසු පියවර
   1. දයාවෙන් හා කරුණාවෙන් ක්‍රියා කළ යුතු වේ.
   2. ප්‍රඥාවෙන් හා බලයෙන් ක්‍රියා කළ යුතු වේ.
   3. ඉවසීමෙන් හා ධෛර්යයෙන් ක්‍රියා කළ යුතු වේ.
   4. දක්ෂතාවයෙන් හා බලයෙන් ක්‍රියා කළ යුතු වේ.

7. ජේසුස් වහන්සේගේ සේවයේ ආදර්ශය ලබන අප
   1. සේවය ලැබීමට යොමුවිය යුතු වේ.
   2. බලය ක්‍රියාත්මක කිරීමට යොමුවිය යුතු වේ
   3. අණසක පැතිරවීමට ක්‍රියා කළ යුතු වේ
   4. සේවය ලැබීමට නොව සේවය කිරීමට යොමු විය යුතු වේ.

8. යෙසායා දිවැසිවරයා ඉදිරිපත් කළ දුක් උසුලන සේවකයා වූයේ
   1. ජේසුස් වහන්සේ 2. ස්නාවක ජොහන් 3. ආබ්‍රහම් 4. මෝසෙස්

9. ජේසුස් වහන්සේ ''ලෝකයේ පව් දුරු කරන දෙවියන්ගේ බැටළු පෝතකයා'' ලෙස හඳුන්වා දුන්නේ
   1. පේදුරු 2. ස්නාවක ජොහාන් 3. පාවුල් 4. සෙකරියස්

10. ජේසුස් වහන්සේ ........................ සිංහාසනයේ ........................ වංශය කෙරෙහි සදහටම රජකම් කරන සේක.
   1. දාවිත්ගේ, ජාකොබ්ගේ
   2. සාමුවෙල්ගේ, ජොසෙප්ගේ
   3. සලමොන්ගේ, ජාකොබ්ගේ
   4. දාවිත්ගේ ජොසෙප්ගේ

papers.lk

11. ස්නාවක ජොහාන්ගේ පියා
1. දිවැසිවරයෙකි. 2. පූජකයෙකි
3. පරිසිවරයෙකි. 4. අයකැමියෙකි.

12. දේව සැලැස්ම ඉටුවීමට කාලය, වයස ,ස්ථානය යනාදි බාධාවක් නොවන බව තේරුම් ගත හැකි සිද්ධීන් අතර වඩාත් ගැලපෙන්නේ
1. කුණාටුව සංසිඳුවීමේ සිද්ධියෙනි.
2. නායින් නුවර වැන්දඹුවගේ පුතා නැගිටුවීමේ සිද්ධියෙනි.
3. සෙකරියස් ට හා එලිසබෙත් ට දරුවකු ලැබීමේ සිද්ධියෙනි.
4. ලාදුරු රෝගීන් සුව කිරීමේ සිද්ධියෙනි.

13. ශාස්ත්‍රවන්තයින් ජේසු බිළිඳු බැහැ දැක නමස්කාර කිරීමට පැමිණි මෙහොතේ සංකේතාත්මකව පුද කළේ
1. රන්, තුවරලා, ගන්දරස
2. රන් , තුවරලා, මැණික්
3. රිදී, තුවරලා, ගන්දරස
4. රිදී, තුවරලා, මැණික්

14. ජේසු බිළිඳාගේ උපත පිළිබඳ එඬේරු ලද දේවදූත ලකුණ වූයේ
1. තාරකාව ක් 2. ගවලෙන ක්
3. ගවයන් කන ඔරුවක් 4. ගවයන් කන ඔරුවක බාවා සිටි බිළිදෙක්

15. නාසරෙත් නුවර පිහිටියේ
1.පිලිප්පියේ 2. ගලීලයේ 3. කායිසාරියේ 4. එපීසයේ

16. ජේසුස් වහන්සේගේ පිළිවෙත අනුව ප්‍රතික්ෂේපයට පත්වූයේ,
1. නායකයින් 2. මිනිසා 3. අධිපතීන් 4. පාපය

17.''ජේසුස්'' යන නමේ අර්ථය,
1. දෙවියන් වහන්සේ අප සමඟය.
2. දෙවියන් වහන්සේ බලවත්ය.
3. දෙවියන් වහන්සේ මුදන සේක.
4. දෙවියන් වහන්සේ පිහිට වන සේක.

18. ජුදෙව් පිළිවෙත අනුව කැප කිරීම පිණිස බිළිඳුන් දේව මාලිගයට රැගෙන යන්නේ දරුවා ඉපිද
1. දින තිහකට පසු 2. දින හතලිහකට පසු
3. දින පනහකට පසු 3. දින අටකට පසු

19. ජුදෙව් සමාජය විසින් දරුවකු වැඩිහිටියකු ලෙස පිළිගනු ලබන වසය වන්නේ
1. අවු. 18 ය 2. අවු. 21 ය 3. අවු. 15 ය 4. අවු. 12 ය

20. ස්නාවක ජොහාන් තුමාගේ කාලයේ ජුදා ආගමික උත්තම පූජක පදවිය දරන ලද්දේ
1. කයාපස්ය. 2. සීසර් 3. හෙරොද් 4. පිලාත්

21. ස්නාවක ජොහාන් තුමාගේ පණිවුඩයේ මූලික හරය වූයේ
1. ජේසුස් වහන්සේ මෙසියස් වහන්සේ බව හඳුන්වා දීම
2. ජේසුස් වහන්සේ බලවත් බව හඳුන්වා දීම.
3. ජේසුස් වහන්සේ මැවුම්කරු බව හඳුන්වා දීම
4. ජේසුස් වහන්සේ නිහතමානී බව හඳුන්වා දීම.

22. ස්නාවක ජොහාන්තුමා පොදු ජනතාවට දුන් පණිවුඩයේ හරය වූයේ,
1. පුද්ගලික සිත්හැරීම හා ආත්මාර්ථකාමීව ක්‍රියා කිරීම
2. පුද්ගලික සිත්හැරීම හා බලය පැතිරිවීමට ක්‍රියා කිරීම
3. පුද්ගලික සිත් හැරීම හා නායකත්වය දැරීමට ක්‍රියාත්මක කිරීම
4. පුද්ගලික සිත් හැරීම හා පරාර්ථකාමීව ක්‍රියා කිරීම

papers.lk

23. වංචනික භාවයෙන් තොරව සාධාරණ හා අවංක ලෙස සේවයේ යෙදෙමින් යුක්තිගරුක ජීවිතයක් ගත කිරීමට ස්නාවක ජොහාන්ගේ පණිවුඩය ලැබුණේ
1. හේවායන්ට
2. පරිසිවරුන්ට
3. අයකැමියන්ට
4. එඬේරුන්ට

24. නිල බලය මගින් අවංක සේවයක් ඉටුකල යුතු බවට ස්නාවක ජොහාන්තුමාගේ පණිවුඩයේ ආදර්ශය ලද පිරිස වන්නේ
1. අයකැමියන්
2. හේවායින්
3. පරිසිවරුන්
4. එඬේරුන්

25. ආදි පිතෘවරයකු ලෙස හැඳින්වුයේ
1. ආබ්‍රහම්
2. පාවුල්
3. දානියෙල්
4. පේදුරු

26. ''එබැවින් ආබ්‍රහම් අපගේ පියාණෝ"යයි සිතින් කියා නොගෙන මනස්ථාපනය වු බව දැක්වෙන ලෙස හැසිරෙන්න.'' මෙයින් කිතුනු අප ලබන ආදර්ශය,
1. ක්‍රියාකාරීව කටයුතු කළ යුතු බව ය.
2. මනස්ථාපනය වන බව පෙන්විය යුතු බව ය.
3. ක්‍රියාකාරි අර්ථාන්විත ඇදහිල්ල තිබිය යුතු බව ය.
4. මනස්ථාපනය පිළිබඳ අදහස් පල කළ යුතු බව ය.

27. ''මට වඩා ආනුභාව සම්පන්න උතුමෙක් එන්නේය.'' මෙම ප්‍රකාශයෙන් හැඟවෙන්නේ ස්නාවක ජොහාන්තුමාගේ,
1. බලවන්ත බව ය.
2. නිහතමානී බව ය.
3. කථිකත්වයක් ඇති බව ය.
4. පරාර්ථකාමී බව ය.

28. මනස්ථාපනයට කැඳවීම පිළිබඳව වඩා නිවැරදි අදහස
1. මනස සෝදිසි කිරීමට කැඳවීමකි
2. ජීවිත පැවැත්මට කරන තර්ජනාත්මක බලපෑමකි
3. මනසට විවේකයන් ලබා දීමකි
4. ජීවිත වෙනස් කිරීමට මඟ පෑදීමකි

29. ශුද්ධාත්මයෙන් හා ගින්නෙන් බෞතීස්ම කරනු ලබන්නේ කවුරුන් විසින්ද?
1. ජේසුස් වහන්සේ විසින් ය.
2. මෝසෙස් විසින් ය.
3. පාවුල් විසින් ය.
4. ස්නාවක ජොහාන් විසින් ය.

30. ස්නාවක ජොහාන්තුමාගේ අනුශාසනා වර්තමාන කිතුනුවන්ට වැදගත් වන්නේ
1. නායකත්වය දැරීමට ය.
2. එකිනෙකා වෙනුවෙන් වැය වීමට ය.
3. වගකීම් දැරීමට ය.
4. එකිනෙකා අභිබවා ක්‍රියා කිරීමට ය.

31. ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ මෙහෙය ඇරඹුයේ
1. සිනගෝගය හා එපීසය ආශ්‍රිතව ය.
2. සිනගෝගය හා ගලීලය ආශ්‍රිතව ය.
3. දේවමාලිගාව හා ගලීලය ආශ්‍රිතව ය.
4. දේවමාලිගාව හා එපීසය ආශ්‍රිතව ය.

32. ජුදෙව් ජනතාවගේ නමස්කාරයේ කේන්ද්‍රස්ථානය වුයේ
1. දේව මාලිගාව ය.
2. සිනගෝගය.
3. ශ්‍රේෂ්ඨාධිකරණය.
4. අධිකරණය.

33. ජේසුස් වහන්සේ ළමා කාලය ගත කළ නගරය වුයේ
1. බෙත්ලෙහෙම් නුවර ය.
2. කායිසාරිය ය.
3. ජෙරුසලම ය.
4. නාසරෙත් නුවරය .

34. ජුදෙව් සමාජයේ 'රබ්බි' යන නාමය භාවිත වුයේ.
1. දිවැසිවරයාට ය.
2. දෙවිඳුන්ට ය.
3. ගුරුවරයාට ය.
4. රජුට ය.

papers.lk

35. නාසරෙත් ධර්මශාලාවේදී ජේසුස්වහන්සේට කියවීමට දෙන ලද දිවැසිවර ග්‍රන්ථය වූයේ

1. ආමොස්ගේ පොත
2. ජෙරමියාගේ පොත
3. යෙසායාගේ පොත
4. මීකාගේ පොත

36. ජුබිලි වසරේදී වූ විශේෂිත කාර්යය වූයේ

1. උත්සව පැවැත්වීම
2. පුද පූජා පැවැත්වීම
3. සංග්‍රහ කිරීම
4. වහලුන් නිදහස් කිරීම

37. ජේසුස් වහන්සේගේ සුභාරංචිය

1. පෑගී සිටින දිළින්දා රැකීම හා ඔවුන්ට සේවය කිරීම ය.
2. වැටී සිටින පොහොසතා නගා සිටුවීම හා ඔවුන් දියුණු කිරීම ය.
3. පෑගී සිටින නායකයින්ගේ වැරදි රැකීම හා ඔවුන් ඉදිරියට ගැනීම ය.
4. වැටී සිටින බලවතා රැකීම හා තව තවත් බලය පැවරීම ය.

38. අපගේ කිතුනු මෙහෙවර විය යුත්තේ,

1. මානසික හා ආත්මික ලෙස හරි දේ නොදකින අය වෙත සේවය ව්‍යාප්ත කිරීම ය.
2. අපගේ තත්ත්වයට හා වයසට ගැලපෙන ලෙස ක්‍රියා කිරීම ය.
3. අප සමග පැහි සිටින අයට සේවය ව්‍යාප්ත කිරීම ය.
4. මානසික හා ආත්මික ගැටළු ඇති අය ප්‍රතික්ෂේප කිරීම ය.

39.ශාරපෙත්හි වැන්දඹුව හා නාමන්ට සුවය ලබා දීම පිළිබඳව ජේසුස්වහන්සේ ඉදිරිපත් කරමින් ඉස්මතු කළේ,

1. ශාරපෙත්හි වැන්දඹුව ආශිර්වාද ලත් කාන්තාවක් බව ය.
2. අන්‍ය ජාතින්ට ද දේව රාජ්‍ය විවෘතව පවතින බව ය.
3. නාමන්ට සුව කල නොහැකි රෝගයක් තිබූ බව ය.
4. ශාරපෙත්හි වැන්දඹුව හා නාමන් පමණක් දේව කරුණාව ලැබූ බව ය.

40. නාසරෙත්හි සෙනඟ ජේසුස් වහන්සේට එරෙහිව ක්‍රියා කළත් උන්වහන්සේ ඊට දැක්වූ ප්‍රතිචාරයෙන් අපට උගත හැකි පාඩම වන්නේ,

1. ගැටළු සහගත තැන්වල රැඳී නොසිටිය යුතු බව ය.
2. ගැටළු එන විට වෙනත් මාර්ගයන් අනුගමනය කළ යුතු බව ය
3. ප්‍රශ්න හමුවේ නොසැලී ක්‍රියා කල යුතු බව ය.
4. ප්‍රශ්න පැමිණෙන බැවින් නිහඬ දිවිපෙවෙතක් අනුගමනය කළයුතු බව ය.

ලකුණු 1X40=40

papers.lk

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

முதலாம் தவணைமதிப்பீடு - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 10 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper II | පැය / மணித்தியாலம் / Hours 02 |

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.ඉතිරි ප්‍රශ්න අතරින් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

1. 1. සණ්දුරු දේශයේ විසුවන්ට ආලෝකයක් වූයේ කවුද?
   2. ස්නාවක ජොහාන්තුමාගේ ''මාර්ගය පිළියෙල කිරීමේ'' සේවය පිළිබඳ අනාවැකි පැවසූ දිවැසිවරයා නම් කරන්න.
   3. ''මෙසියස්'' යන නාමයේ අර්ථය ලියන්න
   4. ''සියලු <u>මිටියාවන්</u> පුරවනු ලබන්නෝය. සියලු <u>කඳු හෙල්</u> පහකරනු ලබන්නෝය.'' ඉරි ඇඳි පදවල පොදු අදහස කුමක්දැයි ලියන්න.
   5. ජුදෙව් සමාජයේ ප්‍රතික්ෂේපය ට පත් වූ ජන කණ්ඩායම් 2 ක් නම් කරන්න.
   6. ''බොහෝ දෙන ඔහුගේ උපත නිමිත්තෙන් ප්‍රීති වන්නාහ'' මෙලෙස පැවසුවේ කාගේ උපත සම්බන්ධව ද?
   7. ජේසුස් වහන්සේගේ සේවය පිළිබඳ නාසරෙත් ප්‍රකාශනයේ සඳහන් වන කරුණු 2 ක් ලියන්න.
   8. ස්නාවක ජොහාන්තුමාගේ වචනය ඇසීමට පැමිණි භේවායන්ට දුන් උපදෙස් 2ක් ලියන්න.
   9. ජුදා සමාජයේ දෙවියන් වහන්සේගේ වැඩ සිටීම සංකේතවත් කළේ කුමකින් ද?
   10. කිතුනු දරුවකු තුළ තිබිය යුතු යහපත් ගුණාංග දෙකක් ලියන්න.

2x10=20

2. 1. ''දිවැසිවරයා'' යනු කවුරුන් දැයි පහදන්න. (ල 2)
   2. දිවැසිවරයකුට පැවරී තිබූ කාර්ය භාරය ලියන්න. (ල 3)
   3. වර්තමාන සමාජය තුළ දිවැසිවරු ලෙස පෙනී සිටිමින් ක්‍රියා කරන්නන් කවරහු දැයි නම් කොට ඔවුන්ගේ සේවය පහදන්න. (ල 5)

3. 1. විශේෂ උපත් පිළිබඳව සුභාරංචිය ලැබුවන් නම් කරන්න. (ල 2)
   2. විශේෂ උපත් පිළිබඳව සුභාරංචිය ලැබුවන් දේව හඬට දැක්වූ ප්‍රතිචාරය වෙන් වෙන්ව ලියා දක්වන්න (ල 3)
   3. කිතුනු ඔබට ලැබෙන දේව කැඳවීම් 2ක් පිළිබඳව හඳුනාගෙන ඔබ ඊට දක්වන ප්‍රතිචාරය ලියන්න. (ල 5)

4. 1. සෙකරියස්ගේ ප්‍රශංසා ගීතයේ ස්නාවක ජොහාන්තුමා පිළිබඳව අවධාරණය කෙරෙන සත්‍යතා 2 ක් ලියන්න. (ල 2)
   2. ස්නාවක ජොහන්තුමා සරල දිවි පෙවෙතක් ගතකළ බවට උදාහරණ 2 ක් දෙන්න (ල 3)
   3. වර්තමාන සමාජයේ පීඩනයට හා අසහනයට පත්වූවන් උදෙසා කිතුනු ඔබට ක්‍රියාකල හැකි ආකාරය පිළිබඳ පහදන්න. (ල 5)

5. 1. ජේසු බිළිඳු කැප කිරීමට රැගෙන ආ අවස්ථාවේ දේව මාලිගයේ රැඳි සිටි දෙදෙනා නම් කරන්න. (ල 2)
   2. ජේසුස් වහන්සේ පිළිබඳව ඔවුන් කළ විශේෂ ප්‍රකාශනයන් සඳහන් කරන්න. (ල 3)
   3. ''මා පියාණන්ගේ මැදුරෙහි සිටිය යුතු බව ඔබ නොදන්නෙහි ද? '' ජේසුස් වහන්සේ කළ මෙම ප්‍රකාශය තුළින් ඔබ ලබන පණිවුඩය ලියා දක්වන්න. (ල 5)

papers.lk

6. 1. ස්නාවක ජොහාන්තුමා බෞතීස්මය ලබා දුන් ස්ථානය හා එහි අරමුණ ලියා දක්වන්න. (ල 2)
2. ස්නාවක ජොහාන්තුමා සාමාන්‍ය ජනතාවට හා අයකැමියන්ට දුන් උපදේශය බැගින් ලියන්න. (ල 3)
3. කිතුනු ඔබට එකිනෙකා සමග බෙදාගත හැකි දේවල් කරුණු 5ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල 5)

7. පහත මාතෘකා අතරින් 2ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න

1. ස්නාවක ජොහාන්තුමා සේවයට සූදානම් වීම
2. දිවැස් වැකි සම්පූර්ණත්වයට පත්වීම
3. ජේසු බිළිඳු වෙනුවෙන් ඉටුකල ජුදෙව් චාරිත්‍ර
4. කිතුනු ජීවිත පැවැත්ම (5x2=10)

papers.lk

# පිළිතුරු පත්‍රය
# 1 වන කොටස

**ක්‍රිස්තියානි ධර්මය** **10 ශ්‍රේණිය**

| | | | |
|---|---|---|---|
| 1. (3) | 11. (2) | 21. (1) | 31. (2) |
| 2. (1) | 12. (3) | 22. (4) | 32. (1) |
| 3. (3) | 13. (1) | 23. (3) | 33. (4) |
| 4. (4) | 14. (4) | 24. (2) | 34. (3) |
| 5. (2) | 15. (2) | 25. (1) | 35. (3) |
| 6. (3) | 16. (4) | 26. (3) | 36. (4) |
| 7. (4) | 17. (3) | 27. (2) | 37. (1) |
| 8. (1) | 18. (2) | 28. (4) | 38. (1) |
| 9. (2) | 19. (4) | 29. (1) | 39. (2) |
| 10. (1) | 20. (1) | 30. (2) | 40. (3) |

1X40=40

## 1 වන කොටස

1. 1) ජේසුස් වහන්සේ
   2) මලාකි දිවැසිවරයා
   3) ආලේපලත් තැනැත්තා
   4) මිනිස් ජීවිත තුළ තිබෙන්නා වූ පාපිෂ්ඨ ස්වභාවයන්
   5) රෝගීන්, අන්‍ය ජාතීන්, අයකැමියන්, එඬේරුන්, දිළිඳුන්
   6) ස්නාවක ජොහාන්තුමාගේ උපත
   7) දිළිඳුන්ට, වහලුන්ට, පීඩිත වූවන්ට සුභාරංචිය ප්‍රකාශ කිරීම
   8) කිසිවෙකුටත් බලහත්කාරකම් නොකරන්න.
   ලැබෙන වැටුපෙන් සෑහි සිටින්න.
   9) ගින්න
   10) සුදුසු ගුණාංගවලට ලකුණු දෙන්න. (ප්‍රේමය, දයාව, ඉවසීම) 2X10=20

2. 1) දෙවියන්වහන්සේගේ කැඳවීම තුළ දේවාත්මානුභාවයෙන් එළිදරව් කරන දේව පණිවුඩය, ජනතාවට පිළිගැන්වූ තැනැත්තා දිවැසිවරයා වේ. (2)
   2) දෙවියන් වහන්සේගේ ඈත්වූ ජනතාව නැවත දෙවියන් වහන්සේ වෙත කැඳවීම (3)
   3) දේව සෙවකයින්, ගුරුවරු, වැඩිහිටියන්, දෙමාපියන් යනාදි අයගේ සේවය පිළිබඳ ලියා ඇති තොරතුරුවලට ලකුණු දෙන්න. (5)

3. 1) සෙකරියස් පූජකතුමා හා මරියතුමිය (2)
   2) සෙකරියස් අවිශ්වාස කල අතර මරියතුමිය නිහතමානීව ''බලන්න මම ස්වාමීන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසු ලෙස මට ඉටුවේවා ය.'' පැවසීම (3)
   3) ගීතිකා කණ්ඩායමට, විවිධ සමිති සමාගම් නායකත්වය පාසලේ විවිධ අවස්ථාවන්වලට, දේවස්ථානයේ කියවීම හා යැදුම් ඉදිරිපත් කිරීමට යනාදියම දක්වන ප්‍රතිචාරවලට දක්වා ඇති කරුණුවලට ලකුණු දෙන්න. (5)

4. 1) ලුක් 1: 13-17 ඇතුලත් කරුණු 2 ක්
   මිදියුෂ මත්පැන් නොබොන බව, ශ්‍රද්ධාත්මයෙන් පූර්ණබව සතුට හා සොම්නස ඇති වන බව යනාදි කරුණු (2)
   2) ඔටු ලෝම වස්ත්‍ර ඇඳීම/ පළගැටියන් හා වනමී අනුභවය (3)
   3) දිළිඳුන්/ රෝගීන් / නුගතුන් පිළිබඳව දක්වා ඇති කරුණුවලට ලකුණු දෙන්න. (5)

papers.lk

5. 1.) සිමියොන් හා අන්නා (2)

2.) ඉශ්‍රායෙල් ජාතින්ගේ ගැලවීම මාගේ දෙනෙතින් දිටිමි. (පෙළපොත 18 පිටුව) (3)

3.) කුඩා අවධියේ සිට අප දෙවියන්වහන්සේගේ සේවය අවබෝධ කරගනිමින් ඊට කීකරුව ක්‍රියාකල යුතු අන්දම පිළිබඳ ලියා ඇති කරුණුවලට ලකුණු දෙන්න. (5)

6. 1.) ජොර්දාන් ගඟ අසල/ මනස්ථාපනයට කැඳවීම (2)

2.) සාමාන්‍ය ජනතාවට - අඳනා දෙකක් ඇති අය නැති අය දෙන්න
අයකැමි - පමණට වඩා බදු අය නොකරන්න (3)

3.) ද්‍රව්‍යමය දේ / ආදරය, කරුණාව , දයාව / දැනුම ප්‍රිය වචන යනාදි ලියා ඇති කරුණුවලට ලකුණු දෙන්න. (5)

7. 1) පෙළපොත 6 පාඩම කරුණු

2) පෙළපොත 1 පාඩම කරුණු

3) පෙළපොත 5 පාඩම කරුණු

4) යහපත් ජීවිත පැවැත්ම අදාල කරුණුවලට ලකුණු දෙන්න.

5X2=10

papers.lk